සියලුම හිමිකම් ඇවිරිණි/
All Right Reserved]

ද මැසනොද් විදුහල, කඳාන
De Mazonod Collage, Kandana

අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ
දෙවන වාර පරීක්ෂණය - 2016 නොවැම්බර්

30 - 11 - 2016

| ගිණුම්කරණය I<br>Accounting I | 12 ශ්‍රේණිය<br>Grade 12 | කාලය<br>පැය 01 |
|---|---|---|

නම : ........................................ පන්තිය : ........................ අංකය : ........................

❖ සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01. පහත කුමන ප්‍රකාශනයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ වඩාත් හොඳින් විස්තර කරනු ලබයිද ?
   1. ආයතනයක තොරතුරු සියලු පාර්ශවයන්ට තීරණ ගැනීම සඳහා සන්නිවේදනය කිරීම
   2. තොරතුරු, වාර්තා කිරීම, වර්ග කිරීම සාරාංශ කිරීම හා විශ්ලේෂණය කිරීම
   3. තොරතුරු මූලික ලියවිලි හා පොත් වල වාර්තා කිරීම
   4. ලෙජර් ගිණුම් වල තොරතුරු වාර්තා කිරීම
   5. කළමනාකරුවන්ගේ භාවිතය සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම (..................)

02. ගිණුම්කරණ තොරතුරු වල ගුණාත්මක ගති ලක්ෂණයක් නොවන්නේ පහත දැ අතුරින් කුමක්ද ?
   1. අදාලතාවය
   2. අවබෝධකර ගත හැකි බව
   3. සංසන්දනාත්මකතාවය
   4. සන්නිවේදනය
   5. විශ්වාසනීය භාවය (..................)

03. පහත කුමන ප්‍රකාශනයක ආයතනයක ගිණුම්කරණ ක්‍රියාවලිය සම්බන්ධයෙන් නිවැරදි වේද ?
   1. සියලු මූලික ලියවිලි ආයතනයේ ගණකාධිකරු පිළියෙල කරයි
   2. ශේෂ පිරික්සුම තුලනය වීමෙන් ගිණුම්කරණ නිවැරදිතාවය තහවුරු කරයි
   3. සුළු මුදල් පොත ආයතනයක ලෙජර් ගිණුමක් ලෙස භාවිතා නොකරයි
   4. ණයට ගැනුම් කරන ආයතනයක ආපසු යැවුම් ජර්නලයක් පැවතිය හැකිය
   5. ණයට භාණ්ඩ විකුණුම් සම්බන්ධයෙන් සාරාංශ ගත සියලු තොරතුරු ණයගැති ගිණුමේ වාර්තා කරයි. (..................)

04. රජය විසින් එකතු කල අගය මත බද්ද (VAT) පැනවීම ගිණුම්කරණය බලපාන පරිසර සාධක වන්නේ,
   1. ආර්ථික හා දේශපාලන
   2. දේශපාලන හා නීතිමය
   3. සමාජ හා ආර්ථික
   4. ආර්ථික හා නීතිමය
   5. වෘත්තිමය හා නීතිමය (..................)

05. ව්‍යාපාර ණයගැතියකුගෙන් රු 50 000 ක ණය ශේෂයක් පියවීමේදී රු 5000 ක වට්ටමක් දෙන ලදි. ලැබුන මුදල අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගන්නා ලදි. මෙම ගනුදෙනුව වත්කම් හා හිමිකමට බලපෑම්කරණ ආකාරය දක්වන්න.

| | වත්කම් | හිමිකම් |
|---|---|---|
| 1. | 50 000 කින් අඩුවේ | 45 000 කින් අඩුවේ |
| 2. | 45 000 කින් වැඩිය | 45 000 කින් වැඩිවේ |
| 3. | 50 000 කින් අඩුවේ | 50 000 කින් අඩුවේ |
| 4. | 45 000 කින් අඩුය | 50 000 කින් අඩුය |
| 5. | 45 000 කින් අඩුවේ | 45 000 කින් අඩුවේ |

(..................)

06. වෙළඳ ව්‍යාපාරයක පහත ගනුදෙනු සටහන් කරන මූලික පොත් වල අනුපිළිවෙළ වන්නේ,
   A මුදලට ගැනුම්
   B ණයට ගැනුම්
   C කාර්යාල උපකරණයක් ණයට ගැනීම
   D දුන් මුදල් වට්ටම්
   1. ගැනුම් ජර්නලය, ගැනුම් ජර්නලය, පොදු ජර්නලය, ලැබීම් ජර්නලය
   2. ගෙවීම් ජර්නලය, ගැණුම් ජර්නලය, ගැණුම් ජර්නලය, ගෙවීම් ජර්නලය
   3. ගෙවීම් ජර්නලය, ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, ලැබීම් ජර්නලය
   4. ලැබීම් ජර්නලය, ගැණුම් ජර්නලය, පොදු ජර්නලය, ගෙවීම් ජර්නලය
   5. ගෙවීම් ජර්නලය, ගැණුම් ජර්නලය, ගැණුම් ජර්නලය, ලැබීම් ජර්නලය (..................)

07. පහත තොරතුරු 2016 මැයි මාසය සඳහා සමාගමකට අදාළ වේ.

| ගනුදෙනුව | ලකුණු කළ මිල | වෙළඳ වට්ටම් | මුදල් වට්ටම් |
|---|---|---|---|
| ණයට ගැනුම් | 100 000 | 20% | 10% |
| ණයට විකුණුම් | 400 000 | 15% | 10% |

ණයහිමියන්ට ගෙවිය යුතු මුදලින් 50% ක් සඳහා මුදල් වට්ටමක් ලබාගෙන මුදල් ගෙවූ අතර ණයගැතියන්ගෙන්ද ලැබිය යුතු මුදලින් 50% ක් සඳහා මුදල් වට්ටම් ලබාදී මුදල් ලබාගෙන ඇත. **මාසයේ ලද මුදල් වට්ටම් හා දුන් මුදල් වට්ටම් පිළිවෙලින් දැක්වෙන්නේ,**

| | **ලද මුදල් වට්ටම්** | **දුන් මුදල් වට්ටම්** |
|---|---|---|
| 1. | 4 000 | 17 000 |
| 2. | 20 000 | 60 000 |
| 3. | 24 000 | 77 000 |
| 4. | 10 000 | 40 000 |
| 5. | 6 000 | 15 000 |

(..................)

08. ආයතනයක ආරම්භක මාසයේ මූලික පොත් වල එකතුන් පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| විකුණුම් ජර්නලය | රු 80 000 | ණයගැති ලැබීම් | රු 40 000 |
| ගැණුම් ජර්නලය | රු 90 000 | ණයහිමියන්ට ගෙවීම් | රු 30 000 |
| ආපසු එවුම් ජර්නලය | රු 10 000 | දුන් මුදල් වට්ටම් | රු 5 000 |
| ආපසු යැවුම් ජර්නලය | රු 20 000 | ලද මුදල් වට්ටම් | රු 10 000 |

**මාසය අවසානයේ ණයගැති හා ණයහිමි ශේෂය පිළිවෙලින්** දැක්වෙන්නේ,

| | **ණයගැති ශේෂය** | **ණය හිමි ශේෂය** |
|---|---|---|
| 1. | 80 000 | 90 000 |
| 2. | 70 000 | 70 000 |
| 3. | 30 000 | 40 000 |
| 4. | 25 000 | 30 000 |
| 5. | 50 000 | 60 000 |

(..................)

09. මූල්‍ය ගිණුම්කරණයට අනුව පහත කුමන දෑ වගකීමක ලක්ෂණයක් වන්නේද ?

A එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි වීම

B නිරාකරණය කිරීමේදී ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායාම

C වර්තමානයේ ගෙවීමට ඇති බැඳීමක් වීම

1. A,B හා C
2. A හා B
3. B හා C
4. A හා C
5. ඉහත කිසිවක් නොවේ

(..................)

10. ව්‍යාපාර ආයතනයක කාලච්ඡේදයකට අදාලව පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| විකුණුම් | රු 200 000 |
| විකුණුම් පිරිවැය | රු 120 000 |
| ලද ගොඩනැගිලි කුලිය | රු 10 000 |
| මෙහෙයුම් වියදම් | රු 70 000 |

කාලච්ඡේදයට අදාල මුලු ආදායම හා මුලු වියදම වන්නේ

| | **ආදායම** | **වියදම** |
|---|---|---|
| 1. | 90 000 | 70 000 |
| 2. | 210 000 | 190 000 |
| 3. | 20 000 | 70 000 |
| 4. | 200 000 | 70 000 |
| 5. | 10 000 | 190 000 |

(..................)

11. පහත කාර්යයන් ගිණුම්කරණ ක්‍රියාවලියේ නිවැරදි අනුපිළිවෙල කුමක්ද ?

A ගනුදෙනු සඳහා මූලික ලියවිලි පිළියෙළ කිරීම

B ශේෂ පිරික්සුම පිළියෙල කිරීම

C ගනුදෙනු අදාල මූලික පොතේ වාර්තා කිරීම

D මූලික පොත් වල එකතුව ලෙජරයට පිටපත් කිරීම

E ව්‍යාපාර ගනුදෙනුව සිදුවීම

1. A,C,D,E,B
2. E,C,A,D,B
3. A,B,C,D,E
4. E,A,C,D,B
5. E,A,D,C,B

(..................)

12. 2016-03-31 දින අසේල සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර වෙනස අවිනිශ්චිත ගිණුමක සටහන් කරන ලදි. පසුව කරන ලද විමර්ශණයේදී පහත දෑ හෙළිදරව් විය.

- රක්‍ෂණ ගාස්තු ගෙවිය යුතු රු 10 000 නිවැරදිව මුදල් ගිණුමට බැර කර ඇතත් රක්‍ෂණ ගාස්තු ගිණුමට හර කර නැත.
- රු 5000 කට යන්ත්‍රයක් මුදලට ගැනිම ගැණුම් ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කර ඇත.
- ණයහිමියකුගෙන් ලද වට්ටම් රු 6000 ක් ණයහිමි ගිණුමට නිවැරදිව හර කර ඇතත් දුන් වට්ටමක් ලෙස දුන් වට්ටම් ගිණුමට හර කර තිබීම

ඉහත වැරදි නිවැරදි කිරිමට පෙර අවිනිශ්චිත ගිණුමේ ශේෂය

1. 2 000 බැර
2. 10 000 බැර
3. 2 000 හර
4. 12 000 හර
5. 10 000 හර

(.................)

13. 2016-03-31 සීමිත අකිල සමාගමේ ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදි. පසුව කරන ලද විමර්ශණයකදී පහත දෑ හෙළිදරව් විය.

A විකුණුම් ජර්නලය රු 50 000 ක් වැඩි යෙන් එකතු කර තිබීම
B ණයහිමියකුට රු 30 000 ක් ගෙවීම මුදල් ගිණුමට නිවැරදිව බැර කර ණයගැතියකුගෙන් ලද මුදලක් ලෙස ණයගැති ගිණුමේ වාර්තා කර තිබීම
C වරිපනම් ගාස්තු 5000 ක් ගෙවීම අදාල ගිණුම් වල 500 ක් ලෙස වාර්තා කිරිම
D රු 40 000 ක ණයට ගැණුම් විකුණුම් ජර්නලයේ සටහන් වීමෙන් ණයට විකුණුම් ලෙස ණයගැති ගිණුමට හර කර විකුණුම් ගිණුමට බැර කර තිබීම.

ඉහත වැරදි වලින් ශේෂ පිරික්සුමෙන් අනාවරණය වන වැරදි වන්නේ,

1. A, හා B
2. A,B හා C
3. B හා C
4. B පමණයි
5. D පමණයි

(.................)

14. රුවන් රු 500 000 ක් වටිනා ගොඩනැගිල්ලක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර රු 100 000 ක බැංකු ණයක් ලබා ගෙන රු 80 000 ක් වටිනා භාණ්ඩ නැවත විකිණීම පිණිස මුදලට ගෙන එම සියළු භාන්ඩ රු 120 000කට ණයට විකුණා ඇත.

ඉහත ගනුදෙනු වලට අදාල වන මුලාශ්‍ර ලේඛන අනුපිළිවෙලින් දක්වෙන්නේ,

1. ගෙවීම් ජ'නලය, ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ඉන්වොයිසිය
2. ජ'නල වච්චරය, ලැබීම් ජ'නලය, ඉන්වොයිසිය, ඉන්වොයිසිය
3. ගෙවීම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ලැබීම් ජ'නලය, ඉන්වොයිසිය
4. ජ'නල වච්චරය, ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ඉන්වොයිසිය
5. ලැබීම් ජ'නලය, ගෙවීම් ජ'නලය, ඉන්වොයිසිය, ලැබීම් ජ'නලය

(.................)

15. අයිතිකරු ව්‍යාපාරයේ බැංකු ණය රු 80 000 ක් සිය පෞද්ගලික මුදලින් පියවා ඇත. එම ගනුදෙනු මූලික ගිණුම් සමීකරණයට බලපාන අයුරු වන්නේ,

| | වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|---|
| 1. | 80 000 අඩුවේ | = | 80 000 අඩුවේ | + | 80 000 අඩුවේ |
| 2. | වෙනස් නොවේ | = | 800 000 අඩුවේ | + | 80 000 අඩුවේ |
| 3. | 80 000 අඩුවේ | = | 80 000 අඩුවේ | + | වෙනස් නොවේ |
| 4. | 800 000 වැඩිය | = | 80 000 අඩුවේ | + | 80 000 වැඩිවේ |
| 5. | වෙනස් නොවේ | = | 80 000 අඩුවේ | + | 80 000 වැඩිවේ |

(.................)

16. මුල්‍ය ගිණුම් කරනුයේ ප්‍රධාන මූලිකාංග 5 නම් කරන්න.

A ..........................................................................................

B ..........................................................................................

C ..........................................................................................

D ..........................................................................................

E ..........................................................................................

17. පහත එක් එක් අයිතමයන් හඳුනා ගනු ලබන්නේ ගිණුම්කරණයේ කුමන මූලිකාංගය යටතේද දක්වන්න.

1. ආපසු යැවුම් ..........................................................................
2. ආපසු එවුම් ..........................................................................
3. ගැනිලි ..........................................................................
4. ණයහිමි ..........................................................................
5. මුදල් ..........................................................................

18. ආයතනයක ණයහිමි ගිණුම් ශේෂය **වැඩිවීමට, අඩුවීමට,** හෝ **වෙනස් නොවීමට** පහත ගනුදෙනු හේතු වන්නේද යන්න දක්වන්න.

**වැඩි වේ / අඩුවේ / වෙනස් නොවේ**

1. ණයට ගැනුම් ..........................................................................
2. මුදලට ගැනුම් ..........................................................................
3. ආපසු යැවුම් ..........................................................................
4. ණයහිමියන්ගේ ලද මුදල් වට්ටම් ..........................................................................

19. ආදල තීරුවේ (✓) ලකුණු යොදා පහත ප්‍රකාශණ සත්‍යද අසත්‍යද බව දක්වන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය** | **අසත්‍ය** |
|---|---|---|
| 1. ණයහිමියකුට මුදල් ගෙවූ විට හිමිකම අඩුවේ | .................... | .................... |
| 2. අයිතිකරු ගැනිලි කල විට වර්ෂයේ ලාභය අඩුවේ | .................... | .................... |
| 3. ණයට විකුණුම් කල විට හිමිකම වැඩි වේ | .................... | .................... |
| 4. ණයට ගැණුම් කල විට වත්කම් වෙනස් නොවේ | .................... | .................... |

20. පහත ගනුදෙනු වලට අදාල **මූලාශ්‍ර ලේඛණය** හා **මූලික පොත්** සටහන් කරන්න.

| **ගනුදෙනුව** | **මූලික ලියවිල්ල** | **මූලික පොත** |
|---|---|---|
| 1. මුදලට විකුණුම් | .................... | .................... |
| 2. මුදල් ගැනිලි | .................... | .................... |
| 3. මුදලට ගැණුම් | .................... | .................... |
| 4. බොල්ණය කපා හැරීම | .................... | .................... |

21. ආයතනයක සුළු මුදල් අග්‍රිමය රු 5000 කි. මාර්තු 01 සුලු මුදල් භාරකරු ළඟ රු 1 000 ක ඉතිරියක් පැවතුනි මාර්තු මාසයේ අයිතිකරුගේ සුලු මුදල් ගැනිලි රු 500 ඇතුලුව සුළු මුදල් ගෙවීම රු 3500 කි.

**අවශ්‍යවන්නේ,**

01. (අ) මාර්තු 01 සුලු මුදල් ප්‍රතිපූර්ණය කිරීම අදාල ජර්නල සටහන දක්වන්න. ..........................................................................

..........................................................................

(ආ) මාර්තු 31 සුලු මුදල් ඉතිරිය ..........................................................................

22. 2016-08-01 අතුල රු 50 000 ක බැංකු ණයක් ව්‍යාපාර කටයුතු සඳහා ලබාගෙන එම ණය මුදල් භාවිතා කර නැවත විකිණීම පිණිස භාණ්ඩ අත්පිට මුදලට ගෙන එම සියලු භාණ්ඩ රු 60 000 කට ණයට විකුණන ලදි.

ඉහත ගනුදෙනුවලින් ගිණුම්කරණ සමීකරණ බලපාන ශුද්ධ වටිනාකම් පෙන්වන්න.

| **වත්කම්** | = | **වගකීම්** | + | **හිමිකම්** |
|---|---|---|---|---|
| .................... | | .................... | | .................... |

23. ආයතනයක් කාර්යාලයේ ප්‍රයෝජනයට ලකුණු කල මිල රු 150 000 ක් වටිනා උපකරණයක් 10% ක වෙළඳ වට්ටමකට යටත්ව ණයට ගන්නා ලදි.

(අ) උපකරණයේ ණයට ගැණුම් වල වටිනාකම කීයද ? ..........................................................................

(ආ) ණයට උපකරණ ගැනීමේ ජර්නල් සටහන වාර්තා කර දක්වන්න. (වටිනාකම සමඟ)

..........................................................................

..........................................................................

30-11-2016
Grade 12
ගිණුම්කරණය

Learning Resource Center
R
De Mazenod College
Kandana

24. පහත ප්‍රකාශණ වලට අදාල වන ගිණුම්කරණ මූලික ගුණාත්මක ලක්ෂණය නම් කරන්න.

| ප්‍රකාශය | ගුණාත්මක ලක්ෂණය |
|---|---|
| 1. ආයතනයක් ලී බඩු වල වෙළඳ පොළ වටිනාකම රු 40 000 කි. එම වටිනාකම ආයතනයේ පොත් වලද වාර්තා කර ඇත. | ........................ |
| 2. ආයතනයක් 2015 වර්ෂයේ ආදායම් ප්‍රකාශණය පිළියෙල කිරීමේදී 2014 වර්ෂයේ ආදායම් ප්‍රකාශණයද ඒ සමඟ දක්වා තිබීම | ........................ |
| 3. ආයතනයක මූල්‍ය ප්‍රකාශ තුලින් විශාල ලාභයක් අනාවරණය කර ඇත. ආයතනයේ කම්කරුවන් වැඩි වැටුප් වැඩි කර දෙන මෙන් ඒ නිසා ඉල්ලම් කර ඇත. | ........................ |
| 4. මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීමට පෙර ශේෂ ගිණුම් ක්‍රියාවලිය තුල පැවතිය හැකි සිසු වැරදි හඳුනාගෙන නිවැරදි කිරීම | ........................ |

25. ගිණුම්කරණයේ මූලික ප්‍රභේද (වර්ග) 2 ක නම් කරන්න.

1. ........................
2. ........................

සියලුම හිමිකම් ඇවිරිණි]
All Right Reserved]

Accounting Accounting Accounting Accounting

**ද මැසනොද් විදුහල, කඳාන**
**De Mazonod Collage, Kandana**

**අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ**
**දෙවන වාර පරීක්ෂණය - 2016 නොවැම්බර්** 30 - 11 - 2016

| | | |
|---|---|---|
| **ගිණුම්කරණය II** *Accounting II* | **12 ශ්‍රේණිය** *Grade 12* | **කාලය** පැය 02 |

❖ **පළමු හා දෙවන ප්‍රශ්න ඇතුලුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.**

**01.** සමීර මාර්තු 01 ආරම්භ කල වෙළඳ ව්‍යාපාරයේ පළමු මාසය තුල පහත ගණුදෙනු සිදුවී ඇත.

01. සමීර රු 100 000 ක් වටිනා මුදල් ද රු 300 000 ක් වටිනා ගොඩනැගිල්ලක්ද යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම
02. බැංකුවකින් රු 50 000 ක ණය මුදලක් ගැනීම
03. නැවත විකිණීම පිණිස රු 80 000 ක් වටිනා බඩු තොගයක් මුදලට ගැනීම
04. නැවත විකිණීම පිණිස රු 70 000 ක් වටිනා බඩු තොගයක් ණයට ගැනීම
05. ලද ගොඩනැගිලි කුලී ආදායම රු 16 000
06. සේවක වැටුප් ගෙව්වා රු 20 000 යි.
07. මුදලට විකුණුම් රු 90 000 විකුණු භාණ්ඩ ගත් මිල (විකුණුම් පිරිවැය) රු 60 000 යි.
08. ණයට විකුණුම් රු 75 000 විකුණුම් භාණ්ඩ ගත් මිල (විකුණුම් පිරිවැය) රු 50 000 යි
09. ණයගැතියන්ගෙන් මුදල් ලැබුනා රු 54 000 දුන් වට්ටම රු 6000 යි.
10. ණයහිමියන්ගේ සම්පූර්ණ ණය මුදල පියවීමට වට්ටමක් ලබාගෙන රු 63 000 ක් ගෙවා ඇත.

**අවශ්‍යවන්නේ,**

01. ඉහත ගනුදෙනු පහත සමීකරණය යටතේ සටහන් කර දක්වීමයි.

**ගොඩනැගිලි + බඩු තොගය + ණයගැති + මුදල් = බැංකු ණය + ණයහිමි + හිමිකම්**

02. සමීර ආයතනයේ මාර්තු මාසය සඳහා ආදායම් ප්‍රකාශණය පිළියෙල කිරීම. (ලකුණු 13)

**02.** සංජීව සමාගමේ පහත ගණුදෙනු අප්‍රේල් මාසය තුල සිදුවී ඇති. (මාසය තුල මුදල් ලැබීම් හා ගෙවීම් කිසිවක් සිදුවී නැත.)

අප්‍රේල් 01 ශේෂයන්

| | |
|---|---|
| කාර්යාල උපකරණ | 150 000 |
| බැංකු ණය | 80 000 |
| ණයගැතියෝ | 50 000 |
| ණය හිමියෝ | 60 000 |
| මුදල් ඉතිරිය | 70 000 |
| ප්‍රාග්ධන ගිණුම | 130 000 |

අප්‍රේල් 02 ඉන්වොයිසි අංක 20 යටතේ අමල්ගෙන් ණයට ගැණුම් වල ලකුණු කල මිල රු 50 000 කි. ගැනීමේදී අඩු කල වෙළඳ වට්ටම රු 5000 කී.

අප්‍රේල් 04 ඉන්වොයිසි අංක 45 යටතේ රුවන්ට ණයට විකුණුම් වල ලකුණු කල මිල රු 80 000 කි. විකිණීමේදී අඩු කළ වෙළඳ වට්ටම රු 8000 කි.

අප්‍රේල් 06 ඉන්වොයිසි අංක 08 යටතේ අමල්ට ආපසු යැවූ භාණ්ඩ වල ලකුණු කල මිල රු 20 000 කි. ගැනීමේදී අඩු කළ වෙළඳ වට්ටම රු 2000 කි.

අප්‍රේල් 08 හර පත් අංක 16 යටතේ රුවන් ආපසු එවූ භාණ්ඩ වල ලකුණු කළ මිල රු 40 000 කි. විකිණීමේදී අඩු කල වෙළඳ වට්ටම රු 4000 කි.

අප්‍රේල් 10 ඉන්වොයිසි අංක 81 යටතේ චන්ද්‍රනගෙන් ණයට ගැනුම් වල ලකුණු කල මිල රු 100 000 කි. ගැනීමේදී අඩු කළ වෙළඳ වට්ටම ලකුණු කල මිලෙන් 10% කි.

අප්‍රේල් 12 ඉන්වොයිසි අංක 46 යටතේ සුනිල්ට ණයට විකුණුම් වල ලකුණු කළ මිල රු 160 000 කි. විකිණීමේදී අඩුකළ වෙළඳ වට්ටම ලකුණු කළ මිලෙන් 5% කි.

අප්‍රේල් 16 හරපත් අංක 09 යටතේ චන්දනට ආපසු යැවූ භාණ්ඩ වල ලකුණු කළ මිල රු 30 000 කි. ගැනීමේදී අඩු කළ වෙළඳ වට්ටම ලකුණු කළ මිලෙන් 10% කි.

අප්‍රේල් 18 බැරපත් අංක 36 යටතේ සුනිල් ආපසු එවූ භාණ්ඩ වල ලකුණු කල මිල රු 60 000 කි. විකිණීමේදී අඩුකළ වෙළඳ වට්ටම් ලකුණු කළ මිලෙන් 5% කි.

අප්‍රේල් 30 කාර්යාලයේ ප්‍රයෝජනයට එකක් ලකුණු කල මිල රු 6000 බැගින් කාර්යාල උපකරණ 5 ක් 20% වෙළඳ වට්ටමකට යටත්ව අරුණ සමාගමෙන් ණයට ගෙන ඇත.

**අවශ්‍යවන්නේ,**

01. ඉහත ගනුදෙනු පහත මූලික පොත් වල වාර්තා කිරීම
   - පොදු ජර්නලය
   - ගැණුම් ජර්නලය
   - විකුණුම් ජර්නලය
   - ආපසු යැවුම් ජර්නලය
   - ආපසු එවුම් ජර්නලය

02. පොදු ලෙජරයේ අදාළ ගිණුම් වලට ඉහත ගනුදෙනු පිටපත් කිරීම (T ආකෘතිය)

03. ගිණුම් ශේෂ කර අප්‍රේල් 30 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කිරීම (ලකුණු 13)

---

**03.** අකිල ආයතනයේ පහත මුදල් ලැබීම් හා ගෙවීම් එය ආරම්භ කළ ජූලි මාසයේ සිදුවී ඇත.

ජූලි 01 ලදුපත් අංක 01 යටතේ රු 80 000 ක මුදලක් යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම

ජූලි 03 වවුචර් අංක 01 යටතේ මුදලට ගැනුම් රු 50 000 කි.

ජූලි 05 ලදුපත් අංක 02 යටතේ මුදලට විකුණුම් රු 60 000 යි.

ජූලි 07 වවුචර් අංක 02 යටතේ විදුලි ගාස්තු ගෙව්වා රු 4 000

ජූලි 10 ලදුපත් අංක 03 යටතේ ලද කඩකුලිය රු 9 000 යි

ජූලි 12 වව්චුර් අංක 03 යටතේ ණයහිමියන්ට මුදල් ගෙව්වා රු 18 000 ලද මුදල් වට්ටම් රු 2000 යි.

ජූලි 14 ලදුපත් අංක 04 යටතේ ණයගැතියකුගෙන් මුදල් ලැබුනා රු 27 000 දුන් මුදල් වට්ටම රු 3000 යි.

ජූලි 18 ලදුපත් අංක 05 යටතේ මුදලට ගැණුම් රු 10 000

ජූලි 20 ලදුපත් අංක 05 යටතේ මුදලට විකුණුම් රු 15 000

ජූලි 22 වව්චර් අංක 06 යටතේ ණයහිමියකුගේ රු 40 000 ක ණය මුදලක් පියවීමට රු 36 000 ක් ගෙවා ඇත.

ජූලි 24 ලදුපත් අංක 06 යටතේ ණයගැතියකුගේ රු 50 000 ක ණය මුදලක් පියවීම රු 45 000 ක් ලබාගෙන ඇත.

ජූලි 31, ලදුපත් අංක 07 යටතේ රු 25 000 ක යන්ත්‍රයක් මිලදී ගෙන ඇත.

**අවශ්‍යවන්නේ,**

01. විකුණුම්, ණයගැති ලැබීම්, ලද ගොඩනැගිලි කුලිය, ප්‍රාග්ධණ, යන විශ්ලේෂණ තීරු සහිත මුදල් ලැබීම් හා ජර්නලය

02 ගැණුම්, ණයහිමි ගෙවීම්, විදුලි ගාස්තු, යන්ත්‍ර, යන විශ්ලේෂණ තීරු සහිත මුදල් ගෙවීම් ජර්නලය

03 මාසයේ ණයට විකුණුම් රු 100 000 ක් හා ණයට ගැනුම් රු 75 000 ක් නම්, පොදු ලෙජරයේ පහත ගිණුම්
**1. ණය ගැති ගිණුම** **2. ණය හිමි ගිණුම** (ලකුණු 8)

---

**04.** සඳකැන් ආයතනයේ මාර්තු 31 දින ශේෂ පිරික්සුම සමාන නොවිය. වෙනස වූ රු 12 000 අවිනිශ්චිත ගිණුමකට හර කරන ලදි. පසුව පහත වැරදි හා අත්හැරීම් හඳුනා ගෙන ඇත.

01. රු 7000 ක බැර පතක් නිවැරදිව ආපසු එවුම් ගිණුමට හර කර ඇතත් ණයගැති ගිණුමට බැර් කර නොතිබීම

02. රු 13 000 ක හර පතක් නිවැරදිව ආපසු යැවුම් ගිණුමට බැර කර ඇතත් ණයහිමි ගිණුමට හර කර ඇත්තේ රු 3000 ක් ලෙසය.

03. ගෙවූ ගෙවල් කුලී රු 8 000 ක් නිවැරදිව මුදල් ගිණුමට බැර කර ඇතත් ගෙවල් කුලී ගිණුමේ බැරට වාර්තා කර තිබීම

04. ගැණුම් ගිණුමේ හර පැත්තේ රු 1000 ක් වැඩියෙන් එකතු කර තිබීම

05. බැංකු ණය ගිණුමේ රු 6 000 ක ආරම්භක ශේෂය ලෙජරයේ බැංකු ණය ගිණුමට පිටපත් කර නොතිබීම

06. ණය ගැතියකුගෙන් රු 2000 ක බොල් ණය කපා හැරීමක් පිළිබඳව ණයගැති ගිණුමේ හෝ බොල් ණය ගිණුමේ කිසිම සටහනක් තබා නැත.

07. ආපසු එවුම් 8000 ණයගැති ගිණුමේ සහ ආපසු එවුම් ගිණුමේ 800 ක් ලෙස සටහන් කර තිබීම

08. විකුණුම් ජ'නල් එකතුව 5000 ක් අඩුවෙන් එකතු කිරීමෙන් ණයගැති ගිණුමේ හා විකුණුම් ගිණුමේ 5000 ක් අඩුවෙන් වාර්තා කිරීම

**අවශ්‍යවන්නේ,**

1. අවිනිශ්චිත ගිණුම
2. වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහන් පොදු ජ'නලයේ සටහන් කර නැත. (ලකුණු 8)

**05.** තරංග සමාගමේ සුළු මුදල් අග්‍රිමය රු 5000 ක ජනවාරි මාසයේ සුළු මුදල් ගණුදෙනු පිළිබඳ විස්තර පහත දක්වේ.

1/1 සුලු මුදල් ඉතිරිය රු 1200
1/1 අග්‍රිමය ප්‍රතිපූර්ණය කල රු 3 800
1/2 වවුචර් අංක 10 යටතේ යතුරු පැදි ඉන්ධන ගාස්තු රු 250
1/4 වවුචර් අංක 11 යටතේ ගැණුම් රු 500
1/6 වවුචර් අංක 12 යටතේ ලිපි ද්‍රව්‍ය ගැනිම රු 400
1/9 වවුචර් අංක 13 යටතේ ආයතනයේ සැරසිලි සඳහා රු 300
1/12 වවුචර් අංක 14 යටතේ වාහන නැවත වීමේ ගාස්තු රු 100
1/14 වවුචර් අංක 16 යටතේ ඡායා පිටපත් කඩදාසි පැකට් එකක් ගැනිමට රු 380
1/16 වවුචර් අංක 17 යටතේ වෙළඳ භාණ්ඩ දවටන පත්තර කඩදාසි ගැනිමට රු 220
1/19 වවුචර් අංක 18 යටතේ ණයහිමියකු වූ ලක්මාල්ට ගෙවීම් රු 500
1/22 වවුචර් අංක 19 යටතේ අයිතිකරු මුදලින් කළ ගැනිලි රු 450
1/24 වවුචර් අංක 20 යටතේ ටැක්සි කුලිය රු 300

**අවශ්‍යවන්නේ,**

1. ඉහත ගනුදෙනු ගමන් වියදම්, ලිපි ද්‍රව්‍ය, වෙනත් වියදම්, ලෙජරය, යන විශ්ලේෂණ තීරු සහිත සුලු මුදල් පොතක වාර්තා කිරිම
2. පොදු ලෙජරයේ අදාල ගිණුම් වලට පිටපත් කිරිම (ලකුණු 8)

---

**06.** සහන් සමාගමේ 2016 ඔක්තෝම්බර් මාසය පහත තොරතුරු සපයා ඇත.

01. ව්‍යාපාරයේ බැංකු ගිණුම

| දිනය | විස්තරය | බැංකු | දිනය | විස්තරය | බැංකු |
|---|---|---|---|---|---|
| 10/1 | ශේෂය | 8 000 | 10/5 | චෙක්පත් නිකුතු (අංක 211) | 4 000 |
| 10/4 | චෙක්පත් තැන්පත් (අංක 540) | 7 000 | 10/9 | චෙක්පත් නිකුතු (අංක 212) | 12 000 |
| 10/8 | චෙක්පත් තැන්පත් (අංක 250) | 9 000 | 10/16 | චෙක්පත් නිකුතු (අංක 213) | 15 000 |
| 10/10 | මුදල් තැන්පතු | 10 000 | 10/26 | චෙක්පත් නිකුතු (අංක 214) | 2 000 |
| 10/15 | චෙක්පත් තැන්පත් (අංක 806) | 5 000 | | | |
| 10/29 | චෙක්පත් තැන්පත් (අංක 681) | 6 000 | | | |
| | | | 1/31 | ශේෂය ප/ගෙ | 13 000 |
| | | 46 000 | | | 46 000 |
| | ශේෂය ඉ/ගේ | 13 000 | | | |

02. බැංකුව විසින් එවන ලද බැංකු ප්‍රකාශණය

| දිනය | විස්තරය | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|
| 10/1 | ශේෂය | - | - | 8 000 |
| 10/4 | චෙක් තැන්පතු (අංක 540) | | 7 000 | 15 000 |
| 10/5 | චෙක් නිකුතු (අංක 211) | 4 000 | | 11 000 |
| 10/9 | චෙක් තැන්පතු (250) | | 9 000 | 20 000 |
| 10/10 | මුදල් තැන්පතු | | 10 000 | 30 000 |
| 10/15 | ණය ගැති (සෘජු ප්‍රේෂණ) | | 11 000 | 41 000 |
| 10/20 | රක්ෂණ වාරික (ස්ථාවර නියෝග) | 8 000 | - | 33 000 |
| 10/25 | චෙක් තැන්පත් (අංක 806) | | 5 000 | 38 000 |
| 10/28 | චෙක් නිකුතු (අංක 212) | 12 000 | | 26 000 |
| 10/30 | චෙක් නිකුතු (අංක 213) | 15 000 | | 11 000 |
| 10/31 | බැංකු ගාස්තු | 2 000 | | 9 000 |

03. ව්‍යාපාරයේ හර බැංකු තීරුව 1 000 ක් වැඩියෙන් එකතු කර ඇත.

**අවශ්‍යවන්නේ,**

1. ව්‍යාපාරයේ බැංකු ගිණුම සංශෝධණ කිරිම (සංශෝධිත බැංකු ගිණුම)
2. සංශෝධිත බැංකු ගිණුමේ ශේෂයන් ආරම්භ කර බැංකු සැසඳුම් විස්තරය (ලකුණු 8)